# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2071/80 – 2018 මැයි 18 වැනි සිකුරාදා – 2018.05.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගයන්ත කරුණාතිලක වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඉහළ විසිදෙකේ කෝරළේ (නැගෙනහිර) සුළු කොට්ඨාසයේ, අංක 553, ලිහිණිවැහැර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, ලිහිණිවැහැර ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කරන ලද අංක කේයූ/ආර්ඩීජී/2015/471 හා 2015.11.15 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර 'ඒ' වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 1.6253 ක් පමණ වූ පහත සඳහන් ඉඩම් කොටස:

01. කැබලි අක්ෂර 'ඒ' – හොලොන්ගොල්ලවත්ත – ප්‍රමාණය: හෙක්. 1.6253

උතුරට: කුඩා ඔය, බී. එච්. ප්‍රනාන්දු සහ බී. ඒ. ප්‍රනාන්දු හිමිකම් කියන හොලොන්ගොල්ලවත්ත; නැගෙනහිරට: බී. එච්. ප්‍රනාන්දු සහ බී. ඒ. ප්‍රනාන්දු හිමිකම් කියන හොලොන්ගොල්ලවත්ත, කුරුණෑගල වැවිලි සමාගම හිමිකම් කියන හොලොන්ගොල්ලවත්ත සහ මාර්ගය; දකුණට: කුරුණෑගල වැවිලි සමාගම හිමිකම් කියන හොලොන්ගොල්ලවත්ත සහ මාර්ගය; බටහිරට: කුරුණෑගල වැවිලි සමාගම හිමිකම් කියන හොලොන්ගොල්ලවත්ත සහ කුඩා ඔය.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/2/2014/ඒ/194.
2018 මාර්තු මස 02 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

06 - 294